# හිටපු පීඨාධිපති මහාචාර්ය හේම විජේවර්ධන මහතාගේ අභාවය……………

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ තෙවරක් පීඨාධිපති ධූරය හෙබ වූ මහාචාර්ය හේම විජේවර්ධන මහතා අවුරුදු 81ක් ආයු වළඳා 2017 අගෝස්තු 28 වන දින ඕස්ට්‍රේලියාවේ දී අභාවප්‍රාප්ත වූ බව මෙයින් සංවේගයෙන් දැනුම් දෙමි.

එතුමා ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ඉතා පිරිසර ගම්මානයක් වූ තල්ගස්පේ ඉපිද, තල්ගස්පේ සිංහල කණිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ශ්‍රී ලංකාවේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් සුවිශේෂී සේවයක් ඉටු කළ විද්වතෙකි.

වර්ෂ 1962 දී වාණිජවිද්‍යා පුහුණු ගුරුවරයකු වශයෙන් සිය වෘත්තීය ආරම්භ කළ මහාචාර්ය හේම විජේවර්ධන මහතා වර්ෂ 1966 දී එවකට ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය නමින් හැඳින්වුණු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගැනීමෙන් පසුව වර්ෂ 1967 දී සහකාර කථිකාචාර්යවරයකු වශයෙන් මෙම විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයට එක්විය. ඉන් පසු වර්ෂ 1970 දී ඇමරිකා එක්සත් ජනපදයේ නිව් හැම්ප්ෂයර් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනපති (MBA) උපාධිය ලබා ගනිමින් එතුමා එකල විදේශ විශ්වවිද්‍යාලයකින් එවැනි උපාධියක් ලබා ගත් ප්‍රථම ශ්‍රී ලාංකිකයන් කිහිප දෙනා අතරට එක්විය. එතුමා වර්ෂ 1982 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ද ලබා ගත්තේ ය.

1972 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිසංවිධාන වැඩපිළිවෙළ යටතේ ස්ථාපිත කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ ආරම්භක අධ්‍යයනාංශ දෙකෙන් එකක් වූ වාණිජවිද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රථම අධ්‍යයනාංශ ප්‍රධාන වශයෙන් පත් වූ එතුමා වර්ෂ 1979 දී කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපති වශයෙන් පත්වන තුරුම වාණිජවිද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන වශයෙන් කටයුතු කළේය. එම අධ්‍යයනාංශයේ ප්‍රගමනය සඳහා එතුමා කළ සේවය විශිෂ්ටය.

කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපති ධූරයට තුන් වතාවක් ම තේරී පත්වූ මහාචාර්ය විජේවර්ධන මහතාගේ නායකත්වය යටතේ පීඨය තුළ නව අධ්‍යයනාංශ කිහිපයක් ම ආරම්භ කරන ලදී. එසේම පීඨාධිපත ධූරයට පත්වී කෙටි කාලයක් ඇතුළත කැනඩාව, බෙල්ජියම හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල විශ්වවිද්‍යාල කිහිපයක් සමග සහයෝගිතා වැඩසටහන් තුනක් ඇතිකරගත් එතුමා මෙම පීඨයේ සහකාර කථිකාචාර්යවරුන්ට එම විශ්වවිද්‍යාලවල පශ්චාද් උපාධි සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම මෙන්ම සප්ත වාර්ෂික නිවාඩු හිමිකම් ලද ආචාර්යවරුන්ට එම සහයෝගිතා වැඩසටහන්වලම කොටසක් වූ අධි ජාත්‍රත්ව වැඩසටහනක් යටතේ එකී විදේශීය විශ්වවිද්‍යාලවල පර්යේෂණ කිරීමට හා ඉගැන්වීම් කටයුතුවලට දායකවීමට ද මහඟු අවස්ථා උදාකර දුන්නේ ය.

කැනඩාව, බෙල්ජියම හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල රජයේ නියෝජිතායතන තුනක මූල්‍ය ආධාර යටතේ පරිගණක උපකරණ, පුස්තකාල පොත් හා පළපුරුද විදේශීය මහාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පශ්චාද් උපාධි අංශයක් ස්ථාපනයටත් එමගින්

1981 වර්ෂයේ සිට ව්‍යාපාර පරිපාලනපති හා රාජ්‍ය පරිපාලනපති යනුවෙන් පශ්වාද් උපාධි පාඨමාලා දෙකක් පවත්වාගෙන යාමට මහාචාර්ය විජේවර්ධන මහතා පියවර ගත්තේය. ඉක්බිතිව පීඨයේ පශ්චාත් උපාධි අංශය විශ්වවිද්‍යාලයේ අංග සම්පූර්ණ ආයතනයක් ලෙස ඉහල නැංවීමෙන් වර්ෂ 1986 දී කළමනාකරණ පශ්වාද් උපාධි ආයතනය පිහිටුවීටම ද පුරෝගිමීව කටයුතු කළේ එතුමා ය. මේ අයුරින් කළමනාකරණ හා වාණිජවිද්‍යා අධ්‍යාපනය පිළිබඳව ශ්‍රී ලංකාද්වීපයේ නව යුගයක් ආරම්භ වයේ මහාචාර්ය විජේවර්ධන මහතා කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයේ පීඨාධිපති පදවිය දැරූ වකවානුව තුළය.

1983 වර්ෂයේදී වාණිජවිද්‍යාව පිළිබඳ මහාචාර්ය පදවිය ලබමින් හේම විජේවර්ධන මහතා එකල කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීටයේ සිටි එකම මහාචාර්යවරයා බවට පත්විය.

විශ්වවිද්‍යාල අධිකාරීන් සමග පැවැත් වූ සාකච්ජාවල ප්‍රතිඵලයක් වශයෙන් අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා උපාධි පාඨමාලාවලට ඇතුල්වීමට පාසල්වල වාණිජවිද්‍යා විෂයයන් හදාරන සිසුන්ට අවසර ලැබෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රවේශ නීතිරීති සංශෝධනය කරවා ගැනීමට ද පුරෝගාමීව ක්‍රියා කළේ මහාචාර්ය විජේවර්ධන මහතා ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රටේ සෑම ප්‍රදේශයකම පාසල්වල වාණිජවිද්‍යා විෂයයන් හදාරා අ.පො.ස. (උසස් පෙළ) පරීක්ෂණයෙන් සමත්වන සිසුන්ට එකඑල්ලේ විශ්වවිද්‍යාල පාඨමාලාවලට ඇතුල්වීමට අවස්ථාව උදාකර දුන් ප්‍රථම විශ්වවිද්‍යාලය වීමේ ගෞරවය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට හිමිවිය.

සේවක අධ්‍යාපන ආයතනයේ ශාඛාවක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පිහිටුවීමට ද මහාචාර්ය විජේවර්ධන මහතා පියවරගත් අතර සේවක අධ්‍යාපන උපාධි පාඨමාලාවේ සන්ධ්‍යා පන්ති පවත්වාගෙන යාම සඳහා එහි සමායෝජක ලෙස ද ක්‍රියා කළේය. එසේම බාහිර ජ්‍යෂ්ඨ උපදේශකයකු හා පාඨමාලා සම්පාදක මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව පාඨමාලාව සැලසුම් කිරීමට හා පවත්වාගෙන යාමටද එතුමා බොහෝ සෙයින් දායක වූයේය.

දිගු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ වාණිජවිද්‍යා හා කළමනාකරණ අධ්‍යාපනය නගාසිටුවීමට උපකාරී වන විවිධ කටයුතුවලදී මහාචාර්ය විජේවර්ධන මහතා උනන්දුවෙන් හා වගකීමෙන් යුතුව ක්‍රියා කළේය. මෙම කටයුතුවලදී ශ්‍රී ලංකාවේ නොයෙකුත් විශ්වවිද්‍යාල හා කාර්මික විද්‍යාල, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, දුරස්ථ අධ්‍යාපන ආයතනය, වරලත් ගණකාධිකාරී ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය, පාඨමාලා සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යනාදි ආයතනවලට එතුමාගෙන් ඉටුවූ සේවය අතිශයින් වැදගත් ය.

පුරා වර්ෂ දහනවයක් තුළ මෙම විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ සේවයෙහි නිරතව සිටි මහාචාර්ය විජේවර්ධන මහතා ඕස්ටේලියාවේ වොලන්ගන් විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ලද ආචාර්ය පදවියක් භාර ගැනීම සඳහා වර්ෂ 1987 දී විදේශ ගත විය. මේ අනුව කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨයට එතුමාගේ සේවය තවදුරටත් ලබා ගැනීමට නොහැකිවීම අභාග්‍යයකි. එහෙත් ඕස්ට්‍රේලියාවේ දී ද සිය නව තනතුරෙහි ඉතා උත්කෘෂ්ඨ සේවයක් ඉටුකළ එතුමා 1997 වර්ෂයේ දී වොලන්ගන් විශ්වවිද්‍යාලය විසින් ඉගැන්වීම සම්බන්ධයෙන් විශිෂ්ටතම ගුරුවරයාට පිරිනැමෙන උපකුලපති ප්‍රදානයකින් ද පුදනු ලැබීය.

එතුමා ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටිය දී ද ශ්‍රී ලංකාව පදනම් කරගත් පර්යේෂණ ව්‍යාපෘති හා අධ්‍යාපනික ප්‍රකාශන මාර්ගයෙන සිය මව් රටේ වාණිජවිද්‍යා හා කළමනාකරණ අධ්‍යාපනයේ උන්නතියට නොයෙක් විට දායක වී ඇත. ගිණුම්කරණය උගන්වා දීර්ඝ පළපුරුද්දක් ලබා ඇති වරලත් ගණකාධිකාරීවරයකු ද වන එතුමා විසින් ලියන ලද ශ්‍රී ලංකාවේ මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ පාඨ ග්‍රන්ථය වර්ෂ 2004 දී ප්‍රකාශයට පත්කර ඇත. මූල්‍ය ගිණුම්කරණය පිළිබඳව ශ්‍රී ලංකාවේ මෙතෙක් පළවී ඇති එකම අංග සම්පූර්ණ පාඨ ග්‍රන්ථය මෙයයි.

මහාචාර්ය විජේවර්ධන මහතා වාණිජවිද්‍යා හා කළමනාකරණ අධ්‍යාපනයේ නොයෙකුත් අංශ පදනම් කරගත් පර්යේෂණ ව්‍යාපෘති රාශියක් නිම කොට ඇති අතර ලෝකයේ නොයෙක් රටවල පැවැත්වුණ සම්මන්ත්‍රණවලදී ඒ ආශ්‍රිත ලිපි ඉදිරිපත් කරමින් දේශන පවත්වා ඇත. එතුමා විසින් ලියන ලද ලිපි විශාල සංඛ්‍යාවක් උසස් පෙළේ අධ්‍යාපනික සඟරාවල පළවී ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කර ඇති කළමනාකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහයේ සිංහල පරිවර්තනයේ කතුවරයා ද එතුමා ය. ආචාර්යවරයක වශයෙන් ගතවූ අවුරුදු 40 ක කාලපරිච්ඡේදය තුළදී එතුමා විසින් ගිණම්කරණය, වාණිජ්‍යය හා කළමනාකරණ අධ්‍යයනය හදාරන සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ලියන ලද පොත් රාශියක් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් ඉටු කළ සුවිශේෂී මෙහෙවර වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් 2007 වර්ෂයේ පැවැත් වූ 34 වන උපාධි ප්‍රදානෝත්සවයේ දී මහාචාර්ය හේම විජේවර්ධන මහතාට විද්‍යාශූරී සම්මාන උපාධිය ප්‍රදානය කරන ලදී.

මහාචාර්ය හේම විජේවර්ධන මහතා සිය අවසන් මෙහෙවර ලෙස 2016 මාර්තු මාසයේ දී “දැනුම හඹා යාම (Quest for Knowledge)” යනුවෙන් සිය ආත්මීය චරිත කතාව ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ වාණිජ හා කළමනාකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පියා මහාචාර්ය හේම විජේවර්ධන මහතා බව මේ පොත පරිශීලනය කිරීමෙන් මොනවට පැහැදිලි වේ.

මෙවන් සුවිශේෂී පුද්ගලයෙකුගේ අත විශිෂ්ට චරිත කථාව මෙරට සැම තරුණයෙකු විසින් ම කියවිය යුතු ග්‍රන්ථයක් ලෙස නොබියව පැවසිය හැකිය.

මහාචාර්ය හේම විජේවර්ධන මහතාට නිවන් සුව ප්‍රාර්ථනා කරමු!